# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2392/15 – 2024 ජූලි මස 08 වැනි සඳුදා – 2024.07.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/243

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.04.25 දිනැති හා අංක 2381/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.04.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්නපුර, ශ්‍රී පාද මාවත, 1 වන පටුමග, අංක 21/2 හි පදිංචි ඒ. කේ. අශෝක රංජිත් මහතා සහ කොළඹ 06, කිරුළපන ඇවනිව්, අංක 54 හි පිහිටි ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/16/2024 හා 2024.05.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 042186 – 18 (2024/07)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

ගොනු අංකය: A/16/2024
නඩු අංකය: IR/COM/03/2020/243

ඒ. කේ. අශෝක රංජිත් මහතා,
අංක 21/2,
01 වන පටුමග,
ශ්‍රී පාද මාවත,
රත්නපුර.

*පළමු පාර්ශ්වය*

*පෙනී සිටීම*

*පළමු පාර්ශ්වය*

නියෝජිත ආර්. ඒ. ගුණතිලක මහතා
ඒ. කේ. අශෝක රංජිත් මහතා

ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 54,
කිරුලපන ඇවනිව්,
කොළඹ 06.

*දෙවන පාර්ශ්වය*

*දෙවන පාර්ශ්වය*

නිතිඥ මනෝලි ජිනදාස මිය,
නිතිඥ නිලූෂි දෙවපුර මිය,
සහකාර කළමනාකරු එම්. ආරියපාල සිල්වා මහතා

*අතර පවතින කාර්මික ආරාවුල*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා පත්කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුල හේතු වී පවත්වන කරුණු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතාගේ 2024.04.10 හා අංක IR/COM/03/2020/243 අනුව සඳහන් වන්නේ ඒ. කේ. අශෝක රංජිත්

මහතා සේවයෙන් ඉවත කරන අවස්ථාවේදී සේවා ගිවිසුම් ප්‍රකාරව ඔහුට හිමි වාර්ෂික නිවාඩු ප්‍රමාණය වන දින 30 ක ප්‍රමාණය සැලකිල්ලට නොගැනීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳ වේ.

*බේරුම්කරණ විභාගය පසුබිම හා එය පැවැත්වූ ආකාරය*

මෙම බේරුම්කරණය 2024.05.07 දින කාර්මික අධිකරණය කැඳවූ අවස්ථාවේ මා විසින් මෙම බේරුම්කරණය ලබාදී ඇති උපදෙස් පරිදි මාස 03 ක කාලයක් තුළ අවසන් කිරීමට අවශ්‍ය බවත් විශේෂයෙන් ඉල්ලුම්කරු පිළිකා රෝගියෙක් බැවින් ඔහුට නඩු දින සඳහා පෙනී සිටීමේ අපහසුතාවයක් ඇති බව ඔහුගේ නියෝජිත ආර්. ඒ. ගුණතිලක මහතා විසින් පෙන්වා දෙන ලදි. මේ අනුව මෙම කරුණ ද සැලකිල්ලට ගෙන මෙම බේරුම්කරණය ඉතා ඉක්මනින් නිම කිරීමේ අවශ්‍යතාවය ඇති බැවින් ඒ සඳහා දෙපාර්ශ්වයේම සහයෝගය මා විසින් ඉල්ලා සිටින ලදි. එමෙන්ම දෙපාර්ශ්වයටම තමන්ගේ පළමු විස්තර ප්‍රකාශය සියළු ඇමුණුම් සමග 2024.05.14 දින මෙම අධිකරණයට පිටපත් 3 කින් සමන්විතව ඉදිරිපත් කිරීමට දැනුවත් කරන ලදි.

*නඩු විභාගයන් පැවැත් වූ දිනයන්,*

2024.05.07
2024.05.14
2024.05.21

2024.05.21 වන දින මෙම නඩුව කැඳ වූ අවස්ථාවේ පළමු පාර්ශ්වය වෙනුවෙන් 2024.05.17 දින ලිපියක් ඉදිරිපත් කරමින් අධිකරණය වෙත දැනුම් දී සිටියේ ඒ. කේ. අශෝක රංජිත් මහතා පිළිකා රෝගී තත්වයෙන් පෙලෙන නිසා බදුල්ල මහ රෝහලේ ප්‍රතිකාර ලබන අතර මේ පිළිබඳව අවධානය යොමු කරන අතරම අවසාන සමථයක් වශයෙන් රුපියල් ලක්ෂයක මුදලක් (රු. 100000/- ) ගෙවීමට කටයුතු කරන ලෙසට ඉහත ලිපියෙන් ප්‍රධාන විධායක නිලධාරී, ලලාන් ප්‍රයිවඩ් ලිමිටඩ් ආයතනයෙන් ඉල්ලීමක් කරන බවයි.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයේ නීතිඥ මනෝලි ජිනදාස මහත්මිය එම ඉල්ලීම සම්බන්ධයෙන් එකඟතාවය පළ කළ අතර අවශ්‍ය වේ නම් එම මුදල ඍජුවම ඉල්ලුම්කරු වෙත ගෙවීමට හැකි බව ප්‍රකාශ කරන ලදි.

ඒ සම්බන්ධයෙන් අධිකරණය කරුණු පැහැදිළි කරමින් ඉල්ලා සිටියේ එය ක්‍රම විරෝධී බැවින් මෙම සමථයකට පත්වීම පිළිබඳ *ගැසට්* නිවේදනය ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ වී දින 14 ඇතුළත එය බටහිර කොළඹ කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ හැකිබව පෙන්වා දෙන ලදි. ඒ අනුව මෙම බේරුම්කරණය සමථයකට පත් වූ බව සඳහන් කරමි.

## ප්‍රදානය

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ඒ. කේ. අශෝක රංජිත් මහතාට දෙවන පාර්ශ්වය විසින් රු. 100000/- මුදලක් (රු. ලක්ෂයක මුදලක්) ගෙවීමට එකඟතාවය පළ කළ බැවින් එයට ඉඩ දෙමින් අදාළ සමථයකට පත් වූ මුදල ලලාන් රබර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් මෙම ගැසට් නිවේදනය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවීමෙන් දින 14 කට පෙර අදාළ මුදල බටහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට මෙයින් නියෝග කර නියම කරමි. මේ අනුව මෙම බේරුම්කරණය සමථයකට පත් වූ බව සඳහන් කරමි. මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදනයක් බව තීරණය කරමි.

**ඒ. බී. හේරත්,**
බේරුම්කරු.

2024 මැයි මස 31 වැනි දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 07- 0067

මගේ අංකය: IR/COM/04/2018/199

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.09.22 දිනැති හා අංක 2194/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.09.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඇහැලියගොඩ, තොරණගොඩ, අංක 33/ඩී හි පදිංචි ඩබ්. ඒ. එස්. වෙත්තසිංහ මයා ඇතුළු සේවකයින් දස දෙනා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් 1. කොළඹ 10, දුම්රිය මූලස්ථානය හි පිහිටි ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල (The Ceylon Railway Uniform Staff Benevolent Fund) 2. කොළඹ 10, දුම්රිය මූලස්ථානය හි පිහිටි ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල, සභාපති 3. කොළඹ 10, දුම්රිය මූලස්ථානය හි පිහිටි ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල, ලේකම් හා භාණ්ඩාගාරික අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A42/2020 හා 2024.06.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය

*නඩු අංකය:* ඒ/42/2020.
IR/COM/04/2018/199.

1. ඩබ්. ඒ. එස්. වෙත්තසිංහ
2. ආර්. ඒ. කේ. ජේ. රණතුංග
3. ඩී. එන්. විජේසූරිය
4. උදාර එස්. ලියන්වල
5. ටී. එම්. එන්. එච්. බණ්ඩාර
6. එම්. මහින්දසිරි
7. එම්. ඩී. පී. එස්. ගුණතිලක
8. කේ. පී. චන්ද්‍රජිත්
9. කේ. ඒ. එන්. චමින්ද
10. කේ. ඒ. සී. අනුරුද්ධ

*පළමු පාර්ශ්වය*

*සහ*

1. ශ්‍රී ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල,
2. සභාපති, ශ්‍රී ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල,
3. ලේකම්, හා භාණ්ඩාගාරික ශ්‍රී ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල,
දුම්රිය මූලස්ථානය, කොළඹ 10.

*දෙවන පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල

ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ප්‍රකාරව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453 F හි පදිංචි විතාරණගේ ජයරත්න වන මා වෙත 2020 ඔක්තෝබර් 17 දිනැතිව යොමු කර ඇත.

*ආරාවුලට තුඩුදුන් කරුණු* :

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු පාදක වී ඇති කරුණ ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතා විසින් 2020.03.10 දිනැති ලිපිය මගින් දක්වා ඇති පරිදි සඳහන් වන්නේ පහත පරිදි වේ.

1. ඩබ්. ඒ. එස්. වෙත්තසිංහ
2. ආර්. ඒ. කේ. ජේ. රණතුංග
3. ඩී. එන්. විජේසූරිය
4. උදාර එස්. ලියන්වල
5. ටී. එම්. එන්. එච්. බණ්ඩාර
6. එම්. මහින්දසිරි
7. එම්. ඩී. පී. එස්. ගුණතිලක
8. කේ. පී. චන්ද්‍රජිත්
9. කේ. ඒ. එන්. චමින්ද
10. කේ. ඒ. සී. අනුරුද්ධ

ශ්‍රී ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදලේ ඩබ්. ඒ. එස්. වෙත්තසිංහ මහතා ඇතුලු සේවකයන් 10 දෙනාට,

01. පත්වීම් සේවා කොන්දේසිවල පරිදි ලබානොගත් ඉතිරි විවේක දින සඳහා ගෙවීම් නොකිරීම.
02. දුම්රිය ගමන් බලපත්‍ර කට්ටල 3ක් වාර්ෂිකව ලබාදීම අත්හිටුවීම.
03. බඳවා ගැනීමේ සේවා කොන්දේසි ප්‍රකාරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන පූර්වාදර්ශ කරමින් 2016 වසර දක්වා අඛණ්ඩව වැටුප් සංශෝධන ලබා දී ඇතත් 2016 වසරේ සිට චක්‍රලේඛ අංක 3/2016 යෙන් පසු වැටුප් සංශෝධන නොකිරීම.

මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න සහ එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව සඳහන් කර ඇත.

පළමු පක්ෂය 2021.01.22 දිනැති පළමු ප්‍රකාශය 2021.02.24 වැනි දින ඉදිරිපත් කර ඇත. ඒ සමගම X1 සිට X14 දක්වා ලේඛන ගොනු කර ඇත. පළමු පක්ෂයේ පළමු ප්‍රකාශය පළමු පක්ෂයේ දසදෙනා අත්සන් කර ඇති අතර X13A සිට X14J දක්වා ලේඛන ද, හිඟ වැටුප් ගණනයට අදාළව X14A සිට X14J දක්වා ලේඛන ද සමග විවේක දින ගෙවීම් ද ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ. පළමු පාර්ශ්වයේ දසදෙනා අතරින් 9ක් ලිපිකරුවන් වන අතර එක් අයෙක් කාර්යාල කාර්ය සහයකයකු වේ. ඔවුන්ගේ ප්‍රකාශවලට අදාළව, X1 සිට X13 දක්වා ලේඛන ගොනු කර ඇත. ඒ අතර පත්වීම් ලිපි, වැටුප් පරිවර්තන සහ ආරාවුලට අදාළ හිඟ වැටුප් යන ආදී ලේඛන ගොනු කර ඇත.

මෙම පරීක්ෂණය අනුව තහවුරු වූයේ මෙම සේවකයන්ට අදාළ නොවන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව ඉහළ වැටුප් තලයන්හි පිහිටුවා රජයේ සේවකයන්ට ලැබෙන සියලු වැටුප් හා වරප්‍රසාද ඒ අනුවම ලබා දී ඇති බවයි. එසේම ඔවුන්ට විශ්‍රාම වැටුප් හිමිකමක් නැත. මේ සියලුම හිඟ මුදල් ඉහත අරමුදලින් ගෙවීමට ගියහොත් දුම්රිය නිල ඇඳුම් සේවකයන්ගේ වැටුපෙන් අය කර ගොඩනගා ගත් ඔවුන්ගේ සුභසාධක අරමුදලට බරපතල හානියක් සිදුවනු ඇති අතර ආඥාපනතින් අපේක්ෂිත අරමුණු ඒ අයුරින්ම ඉටු නොවන බව පැහැදිලි වේ.

එසේම X 11 වශයෙන් ඉදිරිපත් කර ඇති සහකාර කම්කරු කොමසාරිස් ඉරේෂා උදයංගනී මහත්මිය විසින් සමථයක් අනුව ආරාවුලට අදාළව දුන් විසඳුම් නිර්දේශ ද ඊට එකඟ නොවන්නේ නම් බේරුම්කරණය වෙත යොමු කරන බවට දන්වා යවන ලද ලිපිය ද දෙපක්ෂයේ එකඟතාවයෙන් ආරාවුල සමථයට පත්ව ඇති හෙයින් ගොනුව වසා දමන ලද බවට දන්වන ලද ලිපිය X 10 ලෙසත් සමථයට එකඟතාවය පළ කරන ලද ලිපිය X 9 ලෙස ද බඳවා ගැනීමේ කොන්දේසි උල්ලංඝනය වීමට අදාළ ලිපිය X 8 ලෙසත් දුම්රිය ගමන් බලපත්‍ර කට්ටල තුනක් ලබාදෙන බවට දක්වන ලද ලිපිය X 7 ලෙසත්, වැටුප් පරිවර්ථන ලිපි X 6 සිට X 1 දක්වා ද, වෙත්තසිංහ මහතාට ලබා දී ඇති අතර එහි නිත්‍ය කාර්ය මණ්ඩලයට අදාළ කොන්දේසි ද ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

සමස්ථයක් වශයෙන් කරුණු සලකා බැලීමේ දී ශ්‍රී ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල යන්න 1926 ආරම්භ කර ඇති අතර 1947 අංක 50 දරන ආඥාපනතේ සහ 1984, 1992, 1999 වර්ෂවල සංශෝධිත ව්‍යවස්ථාවන් අනුව කටයුතු කරගෙන යන ආයතනයකි.

මෙම ආයතනය මේ අනුව අදාළ කර ගත යුතු වන්නේ සාප්පු සහ කාර්යාල සේවක පනතයි. වැටුප් සකස් කළ යුත්තේ ද ඒ අනුවයි. මෙම තත්ත්වය තේරුම් නොගෙන පාලක මණ්ඩල (දෙවන පක්ෂය) ඔවුන්ට අදාළ චක්‍රලේඛ පාදක කරගනිමින් කටයුතු කිරීම හේතුවෙන් හෝ හිතාමතාම තම කටයුතු සාධාරණීකරණය කර ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් හෝ මෙම අවුල් සහගත තත්ත්වය නිර්මාණය කරගෙන ඇති බව පෙනේ. විධිමත් අයුරින් කම්කරු කාර්යාලයෙන් අදාළ නීති උපදෙස් ලබානොගෙන කටයුතු කිරීමෙන් මෙම අවුල් සහගත තත්ත්වය තවදුරටත් ව්‍යාකූල කරගෙන ඇති බව පෙනේ.

එසේම දෙවන පක්ෂයේ පළමු ප්‍රකාශයේ සඳහන් පරිදි පුත්‍ර ස්නේහය පදනම් කරගෙන මේ සියලු වරප්‍රසාද සංගමයට තේරී පත්වූ නිලධාරීන් විසින් ලබා දී ඇති බවට කර ඇති ප්‍රකාශයට අදාළව සාක්ෂි මෙහෙයවා නැතත්, එවැනි තත්ත්වයක් පූර්ව පාලනය යටතේ පැවැති බවට කරුණු කාරණා යෙදී ඇති ආකාරය අනුව විය හැකි තත්ත්වයක් ඇති බවට ද පැහැදිලි වේ. පවතින තත්ත්වය සමථයකින් තොරව නියෝගයක් හෝ ප්‍රධානයක් වශයෙන් සාධාරණීකරණය කර ගැනීම දෙපක්ෂයේ ම ඒකායන අරමුණ බවත් සමස්ථ පරීක්ෂණය තුළ දෙවන පක්ෂයේ ක්‍රියාකාරීත්වය අනුව මා විසින් අවබෝධකරගත් තත්ත්වය බව ද මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

කෙසේ වෙතත් මෙම බේරුම්කරණයේ දී විසඳීමට අදාළ කරුණ වන්නේ මෙතෙක් ඉහත සඳහන් පරිදි දුම්රිය නිල ඇඳුම් සේවකයන්ගේ අර්ථසාධක සංගමය පරිපාලනය සඳහා පත්කර ගත් නිලධාරීන්ගේ නොදැනුවත්කම හෝ නොසැලකිලිමත්කම හෝ ඥාති සංග්‍රහ හෝ නීතිය නොදන්නාකමින් හෝ කාලාන්තරයක් තිස්සේ එම අරමුදලේ කාර්ය මණ්ඩල සේවකයන් බඳවා ගැනීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සිදුකර ඒ අනුවම වැටුප් ගෙවීම් ද කර ඇති අතර නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ආර්. පී. උදයංගනී මහත්මිය සඳහන් කර ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව දිගින් දිගටම ගෙවීම් කර ඇති බැවින් එකී වරප්‍රසාද නීතිය අනුව එසේම පවත්වාගෙන යා යුතු වේ යනුවෙනි. ඒ අනුව දෙපක්ෂය සමාදානය වී පසුව එම තත්ත්වය සාධාරණීකරණය කර ගැනීම සඳහා බේරුම්කරණය වෙත යොමු කර ගැනීමට කටයුතු කර ඇති බව තහවුරු වේ.

මෙම බේරුම්කරණ පරීක්ෂණයේ දී ද එම සංගමය (දෙවන පක්ෂය) වෙනුවෙන් විධිමත් පරිදි නීතිඥ සහාය ලබාගැනීම කලා ද යන්න සැකය ඇතැම් විට උද්ගත විය. දෙවන පක්ෂය නීතිඥවරුන් මාරු කිරීම විභාග දිනවල නීතිඥ සහාය ලබා නොගැනීම, නීතිඥ ගෙවීම් පැහැර හැරීම ආදී අවුල් සහගත තත්ත්වයන් පරීක්ෂණ ක්‍රියාවලියේ දී දැකගත හැකි විය.

යම්කිසි ආරාවුලක් බේරුම්කරණයට යොමු කරන්නේ නීතිය අනුව කටයුතු කිරීමට නොව සාධාරණ සහ යුක්ති සහගතව බේරුම්කරණයක් කිරීම සඳහාය. එහිදී බේරුම්කරුවෙකුගේ මූලික වගකීම වන්නේ සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් ලබා දීමයි. එහිදී නීතිය අනුවම කටයුතු කිරීම අදාළ නොවන අතර සාධාරණත්වය මූලික වන අයුරින් කටයුතු කිරීම බේරුම්කරණයේ වගකීමයි.

සාක්ෂි අනුව තහවුරු වී ඇති පරිදි මෙම අරමුදල ද්‍රවශීලතාවය කෙරෙහි බලපාන ආකාරයට 2016 වර්ෂයට අදාළව ගිණුම් වාර්තාව අනුව ආදායම් බදු වගකීම රු. 20,811,878.00 ක් වී ඇති බව සඳහන් කර තිබුණි. 2015, 2016 වන විටත් රු. 21,609,625.00 ක ඍණ අගයක් ගෙන ඇති ආදායම් සංචිතයට එම වසරේ බදු වගකීම ගැලපූ විට එකී ඍණ අගය රු. 42,421,503.00 ක් දක්වා වැඩි වී තිබී ඇති බව දැක්වේ. මෙය ද අදාළ අරමුදලේ ද්‍රවශීලතාවය පිළිබඳව බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය කෙරේ යනුවෙන් පැහැදිලිව දක්වා ඇත.

කෙසේ වෙතත් පාලක මණ්ඩලයේ අදූරදර්ශී ක්‍රියා හේතුවෙන් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි පරිගණක මෘදුකාංගයක් සඳහා 2013 - 2015 කාලය අතරතුර පාලක මණ්ඩලය රු. 549200.00 නිකරුණේ වැය කර ඇති බව ද සනාථ වේ. ඒ අනුව සනාථ වන්නේ එවකට සිටි පාලක මණ්ඩලය දූරදර්ශීව කටයුතු කර නැති බවයි. එසේම මෙය ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව වැටුප් ගෙවීමට කටයුතු කළ ආකාරයේ ම ආයතනය පැත්තෙන් බලන කළ අනාර්ථික සහ අඥානවන්තව කළ කටයුත්තකි.

එසේම දනට සේවයේ නියුතු (පළමු පක්ෂය) සේවක පිරිස සහ පරිපාලනය සඳහා පත් වූ නිලධාරින් විධිමත් පරිදි ලේඛන පවත්වා ගනිමින් කාර්යක්ෂමව අවශ්‍ය පියවර ගෙන නැතිකමින් අයකරගත යුතුව ඇති ණය මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇති බව ද එහි පැහැදිලිව දක්වා ඇත. 2019 වර්ෂයේ පමණක් රු. ලක්ෂ දෙකකට ආසන්න මුදලක් ඒ තබ්බි රාජා මයා, ඩබ්. පී. එස්. කේ. කුමාර සහ එස්. පී. හේවාවිතාරණ යන අයගෙන් අයකර ගැනීමට හැකි වී නැති බව ද දක්වා ඇත. එය පැහැදිලිව පරිපාලනයේ සහ මෙම පරීක්ෂණයට අදාළ නිලධාරින්ගේ ද (මෙම බේරුම්කරණයට අදාළ පළමු පක්ෂයේ ද) දුබලතාවයකි. ආඥාපනතේ 18(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම 2015/16 වර්ෂයෙන් පසුව මහ සභාව විසින් ඉටුකර නැති බවත් (ඉදිරි වර්ෂයට අදාළව සංස්ථාවේ වටිනාකම් සහ ණය ප්‍රමාණයට අදාළව ශේෂ පත්‍රයක් ඉදිරිපත් කර නැත.) ඒ අනුව තම ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් අරමුදලේ සාමාජිකයන්ට හෝ පාලකයන්ට මේ වන විට පැවති නැති බව ද පෙනී යයි. අරමුදලේ මහා සභාවට ඉදිරිපත් කළ විගණන වාර්තාව අනුව එම තත්ත්වය හෙළිදරව් කර නැත. ඒ අනුව පළමු පක්ෂය මෙන්ම දෙවන පක්ෂය ද විධිමත්ව කටයුතු කර නැති බව සනාථ වේ. ඒ අනුව,

(අ) වෙනත් නිරීක්ෂණ යටතේ 7 (ආ) 6/2006 ජාතික වැටුප් සහ සේවක සභා කොමිෂන් සභාවේ විමසීමකින් තොරව එම වැටුප් ක්‍රම පාලක සභාව යොදා ගැනීම.

(ආ) ගම්පහ දිසා අධිකරණයේ අංක 19011 දරන බෙදුම් නඩුවේ අංක ඩී 701/202 දරන සංශෝධිත අතුරු නඩු තීන්දුවේ අට වන නියෝගයට අනුව රාගම පිහිටි මාරගහවත්ත ඉඩමට අයත් බලයලත් මිනින්දෝරු තැනගේ අංක 2079 දරන පිඹුරු සැලැස්මේ "H" අක්ෂරයෙන් දක්වෙන පර්චස් 19.1 බිම් කොටස මෙම නඩුවේ අට වන විත්තිකරු වන ශ්‍රී ලංකා නිල ඇඳුම් සේවක අර්ථසාධක අරමුදල වෙත පවරා දීමට 2002 ජූනි මස 02 දිනැති නඩු තීන්දුව මගින් තීන්දු කර තිබුණි. ඒ අනුව මෙම අරමුදල නමින් ඔප්පුවක් සකසා අරමුදලේ වත්කමක් ලෙස පවරා ගැනීමට 2002 ජූනි මස 02 දිනට පසු ක්‍රියාත්මක වූ එකදු පාලක කමිටුවක්වත් පියවර ගෙන නොතිබුණ අතර 2019 වර්ෂය වෙනුවෙන් වරිපනම් බදු ගෙවා තිබුණේ ඉඩමේ මුල් අයිතිකරු නමින් බව දක්වා ඇත. මෙය ව්‍යවස්ථා සංග්‍රහයේ 35.01 වගන්තියට පටහැනිව කටයුතු කිරීමක් බව එහි පැහැදිලිව දක්වා ඇත.

ඒ අනුව පෙනී යන්නේ පාලක මණ්ඩලයේ උදාසීනත්වය සහ නොදනුවත්භාවයයි.

(ඇ) 2016 වර්ෂය තුළ මහා සභාව අනුමත වියදම් ඇස්තමේන්තුව අභිබවා වියදම් කර ඇති අතර ජාතික විගණන වාර්තාව අනුව වියදම් කර ඇති අතිරික්ත මුදල රු. 13,280,461.00 කි. ආයතනයේ සේවකයන් සෙනසුරාදා වරුවක් සේවය කළ යුතු වුවත් 2019 වර්ෂය තුළ එසේ සේවය කර මෙම පරීක්ෂණයට අදාළ සේවකයන් දහදෙනා අතිකාල ලබාගැනීම අනුව වැඩිපුර ලබාගෙන ඇති මුදල රු. 536,036.00ක් බව වාර්තාව දක්වා ඇත. ඒ අනුව මෙම සේවකයන් දස දෙනා වංචනිකව කටයුතු කර ඇති බව තහවුරු වේ. විධිමත් පරිපාලනයක් හෝ අධීක්ෂණයක් නැති කමින් මෙය සිදුවී ඇත. ඒ අනුව සනාථ වන්නේ පළමු පක්ෂයට අදාළ නිලධාරීන් නඩත්තු කිරීම සඳහා දෙවන පක්ෂය දුම්රිය නිල ඇඳුම් සේවකයන්ගේ සුභ සාධන අරමුදලේ අවිධිමත්ව වියදම් කර ඇති බවයි. එය ආඥා පනතේ අරමුණුවලට හාත් පසින්ම ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් බව පැහැදිලිව පෙනී යයි. නිලධාරීන්ගේ නොදැනුවත් බව ප්‍රයෝජනයට ගනිමින් මෙම ගැටළුවට අදාළ සේවක පිරිස ද අරමුදලට බරපතල හානියක් වන අයුරින් කටයුතු කර ඇති බව ද ඒ අනුව නිරීක්ෂණය වේ.

මෙම සමාගමේ නිලධාරීන් වශයෙන් පත්වූ පිරිස් අධිකරණයේ අංක 19011 දරන බෙදුම් නඩුවේ තීන්දු ප්‍රකාරව අංක D 701/202 දරන සංශෝධිත අතුරු නඩු තීන්දුව අනුව 2079 සැලැස්මේ H අක්ෂරය දරන පර්චස් 19ක් පවරා දී තිබුණ ද කිසිදු පාලක කමිටුවක් ඒ අනුව භුක්තිය භාරගෙන කටයුතු කර නැති බව ද එසේම එහි පරිපාලනයට පත්වූ නිලධාරීන්ගේ නොදැනුවත්කමින් ප්‍රයෝජන ගෙන වරප්‍රසාද රාශියක් රාජ්‍ය සේවකයන් ලෙස ලබාගනිමින් අරමුදලට හානිවන අයුරින් පළමු පක්ෂය දිගින් දිගටම කටයුතු කර ඇති බව ද නිරීක්ෂණය වේ. අරමුදලේ පරිපාලනයට පත් නිලධාරින් ද කුමන හෝ හේතුවක් මත තමන්ගේ සහ සහෝදර නිලධාරීන්ගේ යහපතට ඇති කරන ලද මෙම අරමුදල ද්‍රවශීලතාවයට ලක්වන අයුරින් කටයුතු කර ඇති බව විගණන වාර්තාව අනුව තහවුරු වේ. ඒ අනුව මෙහිදී අරමුදලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කිසිවෙකු පෙනී සිටින බවක් නිරීක්ෂණය නොවේ.

මේ අනුව පැහැදිලි වන්නේ මෙම ආයතනයේ පරිපාලන සඳහා වරින්වර තේරී පත්වූ ඇතැම් පාලක මණ්ඩල ආඥාපනතේ අරමුණුවලට හෝ තම අරමුදලේ අභිවෘද්ධියට කටයුතු කර නැති බවයි. එසේම දැනට මෙම පරීක්ෂණයට ඉදිරිපත් වන දෙවන පක්ෂයේ නිලධාරීන්ට අවශ්‍ය වන්නේ ද කුමන හෝ තීන්දුවක් මගින් මෙතෙක් පවත්වාගෙන ආ මෙම අවිධිමත් ක්‍රමය සාධාරණීකරණය කර ගැනීම බව ඔවුන් මෙම බේරුම්කරණ නියෝගය කඩිමුඩියේ ලබාගන්නට දරන උත්සහය සහ පරීක්ෂණ ක්‍රියාවලියේ දී කටයුතු කළ ආකාරය අනුව පෙනී යයි. පවතින තත්ත්වය දිගින් දිගටම පවත්වා ගැනීම සාධාරණීකරණය කර ගැනීම දෙපක්ෂයේම අරමුණ වූ බව ඔවුන්ගේ ක්‍රියා කලාපය අනුව මා හට අවබෝධ වූ තත්ත්වයයි.

එහෙත් මෙම ආඥාපනත අනුව එහි මුඛ්‍ය අරමුණ වන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවේ 5800ක් පමණ වන නිල ඇඳුම් සේවකයන් සඳහා සහන සලසා දී ඔවුන්ගේ සහ පවුල්වල සාමාජිකයන්ගේ සුභ සාධනය සඳහා පවත්වාගෙන යාමයි. එම අරමුණ පත්වන හැම පාලක මණ්ඩලයක්ම අවබෝධ කර නොගැනීම හේතුවෙන් හෝ හිතාමතාම කටයුතු කිරීම හේතුවෙන් තමන්ගේ මෙන්ම සහෝදර නිලධාරීන්ගේ යහපත උදෙසා ඇති කළ මෙම සුභසාධක අරමුදලට හානිවන අයුරින් ආත්මාර්ථකාමීව සහ වගකීම් විරහිතව කටයුතු කිරීම කර ඇති බව මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ කරුණු අනුව සහ පරීක්ෂණ ක්‍රියාවලියේ දී දෙවන පක්ෂයේ නිලධාරීන්ගේ උදාසීන ක්‍රියාකාරිත්වය තුළින් මොනවට සනාථ වේ. ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති 2020.02.27 දිනැති විගණන වාර්තාව අනුව ආඥා පනතේ වගන්තිවලින් බැහැරවීමට අදාළව දක්වා ඇති,

1. 2015 - 2016 වසරෙන් පසුව සංස්ථාවේ වටිනාකම් සහ ණය සඳහන් ශේෂ පත්‍රයක් ඉදිරිපත් කිරීම කර නැත. (නොසැලකිල්ල) වංචනික ක්‍රියා සඳහා දොර විවෘත කිරීමකි. (ඉහත කී වංචනික ක්‍රියා හෙළිදරව් වීම වළක්වා ගන්නට කළ කටයුත්තක් ද යන සැකය ජනිත වේ.)

2. 28(1) වගන්තය අනුව වාර්ෂික මහා සභාවක් සෑම වසරකම ඔක්තෝබර් 31 දිනට ප්‍රථම කැඳවිය යුතු වුව ද එය 2016 වසරෙන් පසුව සිදුකර නැත. නීතිගත සංස්ථාවේ මුදල් වර්ෂය ආඥා පනතින්ම දක්වා තිබිය දී විධිමත් කාර්ය පටිපාටියකින් තොරව අප්‍රේල් 1 සිට මාර්තු 31 දක්වා කාලය විගණක වර්ෂය වශයෙන් වෙනස් කර තිබීම ද සාවද්‍ය තත්ත්වයකි. පනතක් වෙනස්

කිරීම පනත් සංශෝධනයකින්ම කළ යුතු වුව ද මෙම නීතිමය තත්ත්වයවත් වටහාගන්නට තරම් දැනුමක් හෝ උවමනාවක් මෙම පාලක මණ්ඩලයට පැවති නැති අතර වන්නාට වාදීව කටයුතු කිරීම හෝ හිතාමතාම මෙම සේවකයින්ගේ අවශ්‍යතා ඉටු කිරීමේ වුවමනාවක් මෙම පාලක මණ්ඩල සාමාජිකයන්ට තිබුණා ද යන සැකය ඇති වන අයුරින් කටයුතු කර ඇත.

3. විගණන වාර්තාවට අනුව පාලක මණ්ඩලය විසින් හිස් චෙක්පත් අත්සන් කර තැබීම වංචනික ක්‍රියාවලට අතවැනීමකි. මෙහිදී ද දෙපක්ෂයේ එකඟතාවයෙන් හෝ වංක සහයෝගයෙන් කළ කටයුත්තක් ද යන සැකය ජනිත වේ එසේම සේවක අතිකාල ගෙවීමේ දී නීතිමය තත්ත්වයෙන බැහැරව පැයට දෙක බැගින් ගෙවීම සහ සෙනසුරාදා දිනය වරුවක් සේවය කිරීමට නියමිතව තිබිය දී එසේ සේවය කළ අයට මුළු දිනය සඳහාම අතිකාල ගෙවීම වැනි පාලක මණ්ඩලයේ අදූරදර්ශී හෝ නොදැනුවත්කමින් හෝ වංක සහයෝගයෙන් කළ ක්‍රියා කලාප හේතුවෙන් අරමුදලට බරපතල හානි සිදු වී ඇති අතර අවධානමකට ද පත්කර ඇති බව පැහැදිලිව පෙනී යයි.

එසේම ඉහත කී ආකාරයේ අරමුදල පාලනය සඳහා පත් වූ නිලධාරීන්ගේ දුර්වලතා, අදූරදර්ශී බව හෝ ආත්මාර්ථකාමී බව හෝ අඥානවන්ත බව හෝ මුල් ප්‍රකාශය පරිදි ඥාති සංග්‍රහ හේතුවෙන් සේවක මණ්ඩලය විසින් ද අයුක්ති සහගතව හෝ වංක සහයෝගයෙන් හෝ උපරිම ප්‍රයෝජන ලබාගෙන ඇති බව ද වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

සාප්පු හා කාර්යාල සේවක පනත (1954 අංක 19) මෙම කාර්ය මණ්ඩලයට අදාළ පනත වන අතර ඒ පිළිබඳව විධිමත් උපදෙස් ලබා ගැනීමකින් තොරව පාලක මණ්ඩලය විසින් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින්ට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව වැටුප් ගෙවීම, අතිකාල ගෙවීම් දුම්රිය ගමන් බලපත්‍ර ලබාදීම ආදී මෙම සේවකයින්ට අදාළ නොවන වරප්‍රසාද රාශියක් ලබා දීමෙන් කළ කටයුතු හේතුවෙන් දුම්රිය නිල ඇඳුම් සේවකයින්ගේ අර්ථසාධක අරමුදලට බරපතල අලාභ හානි සිදු වී ඇති බව විගණන වාර්තාව අනුව තහවුරු වේ. එසේම ව්‍යවස්ථාවේ වගන්ති සහ අරමුණුවලට පටහැනිව ණය ලබාදීම අතිකාල ලබාදීම විධිමත් අධීක්ෂණයකින් තොර වීම වැනි කරුණු හේතුවෙන් අරමුදලට අලාභ හානි සිදු වී ඇති බව විගණන වාර්තාව අනුව ද සනාථ වේ. මේ සම්බන්ධව ඒ ඒ කාල වල සේවය කළ අරමුදලේ නිලධාරීන් සියල්ල එක්ව සහ වෙන් වෙන් වශයෙන් වගකිව යුතු තත්ත්වයක් පවතින බව පැහැදිලිව නිරීක්ෂණය වේ. ඔවුන් ද මෙම නිල ඇඳුම් සේවකයින් අතරින් තෝරා පත් කර ගත් දුම්රිය නිල ඇඳුම් සේවකයින් වන හෙයින් ද කම්කරු නීති පිළිබඳ දැනුමක් ඔවුන්ට නැති හෙයින් ද කම්කරු දෙපාර්තමේන්තුව වැනි අදාළ ආයතන හරහා විධිමත් උපදෙස් ලබා නොගැනීම සහ නොදැනුවත් භාවය හේතුවෙන් මෙම අර්බුදකාරී තත්ත්වයට මුහුණ පා ඇති බව පෙනී යයි. කම්කරු නීති පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට තීන්දු තීරණ ගැනීමට තරම් දැනුමක් හෝ උනන්දුවක් හෝ උවමනාවක් ඔවුන්ට තිබී නැති අතර උවමනාවෙන්ම එහි සේවයට බඳවා ගත් මෙම පරීක්ෂණයට අදාළ සේවකයින්ට ඔවුන්ගේ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කපටි බුද්ධිය පැවතීම හේතුවෙන් හෝ දෙපක්ෂයේ එකඟතාවයෙන් හෝ කටයුතු කළා ද යන සැකය බේරුම්කරණයේ දී ඔවුන් කටයුතු කරගෙන ගිය ආකාරය සලකා බැලීමේ දී ද මොනවට පැහැදිලි විය.

එසේම මෙම අරමුදලේ පාලක මණ්ඩලය වරින් වර ඡන්දයෙන් හෝ නිතරඟයෙන් තේරී පත්වන එම සංගමයට සාමාජිකයින් වන අතර ඔවුන් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින් වේ. ඔවුන්ට අදාළ චක්‍රලේඛන මෙම අරමුදලේ කාර්ය මණ්ඩලය සඳහා ද යොදාගෙන කටයුතු කිරීම සහ අදාළ කම්කරු නීති අදාළ කර නොගැනීම, නිවැරදිව නීතිය වටහා නොගැනීම සහ ආඥා පනතේ අරමුණු අනුව කටයුතු නොකිරීම යන කරුණු මෙම ගැටළුව නිර්මාණයවීමට මූලිකවම හේතු පාදක වී ඇති බව පැහැදිලි වේ.

කුමන හේතු පදනම් කරගෙන හෝ මෙම අරමුදලේ පාලක මණ්ඩලය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව වැටුප් ලබාදීම, වැටුප් වර්ධක ලබාදීම, උසස්වීම් ලබාදීම, අනිකුත් වරප්‍රසාද රාජ්‍ය සේවකයන්ට අදාළ චක්‍රලේඛන අනුව මෙම සේවකයින්ට ද ලබාදීම දිගින් දිගටම කර ඇති අතර මෙම සේවකයින්ට අදාළ අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්ත භාරකාර අරමුදල වැනි අරමුදල් සඳහා සේවකයින්ගේ ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවකයින්ගෙන් අයකර ගැනීමට අදාළ කොටස පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බව හෝ ඒ පිළිබඳ පැහැදිලි තත්ත්වයක් සාක්ෂි දීමේ දී හෝ ඉදිරිපත් කර නැත. කම්කරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂණවල දී ද වැටුප්

ගෙවීමේ කටයුතුවලට අදාළව සාකච්ඡා කර ඇතත් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්ති භාර අරමුදල්වලට අදාළව කිසිදු උපදේශයක් ලබා දී ඇති බවට දක්නට නැත. පළමු පක්ෂයේ ඉදිරිපත් කළ හිඟ වැටුප් ගණනය වන X13(A) සිට X13(J) සහ X14(A) සිට X13(J) ලේඛන අනුව අර්ථසාධක සහ සේවා නියුක්ත භාර අරමුදල් අයකිරීමක් ද කර ඇති බවක් දක්වා නැත. ඒ අනුව මෙම ව්‍යවස්ථාපිත ගෙවීම්, සේවකයින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව විශ්‍රාම වැටුප් ගෙවීම, වැටුප් සංශෝධනය කිරීම ආදිය පිළිබඳව කටයුතු කිරීමට සිදුවුවහොත් මෙම අරමුදලට සිදුවන හානිය සහ එහි සාමාජිකයන්ගේ යහපත උදෙසා ඇති කළ මෙම අර්ථසාධක අරමුදල එහි කාර්යාල සේවකයින් වශයෙන් බඳවාගත් මෙම පළමු පක්ෂයේ අතලොස්සක් වන සේවකයින් දසදෙනෙකුගේ සුහසාධක අරමුදල බවට පත්වී 1947 අංක 50 දරන ආඥා පනතේ 3 වන වගන්තියෙන් අපේක්ෂා කළ අරමුණු කිසිවක් ඉටුකළ නොහැකිව වියැකී යනු ඇත. එසේ නොවුන ද අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්ති භාර අරමුදල් ගෙවීම අනිවාර්ය බැවින් අරමුදලට බරපතල හානියක් වන බව ද පෙනේ. පාලක පක්ෂයට එයින් කිසිදු අගතියක් නොවනු අතර හානිය වන්නේ අරමුදලට සහ එහි සාමාජිකයන්ටයි.

ආර්-1 (එක්ස්) වශයෙන් ලකුණු කර ඇති අරමුදලේ ආඥා පනතේ 16 වන වගන්තියේ අවසන් කොටස අනුව 21 වන වගන්තියේ කොන්දේසිවලට යටත්ව අවශ්‍ය නව නීති සම්පාදනය කොට වර්තමානයට ගැලපෙන පරිදි එහි කටයුතු සඳහා පත්කර ගන්නා මෙහෙකරුවන්ගේ අයිතිවාසිකම් ද සුරකෙන ආකාරයේ සංශෝධනයක් මෙම පනතට ඇති කර ගැනීම හරහා ඉදිරියේ දී මෙවැනි ප්‍රශ්න ඇති නොවන ආකාරයෙන් කටයුතු කිරීමට අදාළව බලධාරීන් කටයුතු නොකළ හොත් මෙම අරමුදල බරපතල අර්බුදයකට පත්වීමේ අවධානමක් ඇති බව ද පෙනී යයි. එබඳු අවශ්‍යතාවයක් සපුරා ගැනීමේ දී ආඥාපනත අනුව අරමුදලේ භාරකරුවන් වන

1. දුම්රිය සාමාන්‍යාධිකාරිතුමා
2. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්තුමා
3. නීතිපතිතුමා යන ආදී නිලධාරීන්ගේ උපදෙස් සහ මග පෙන්වීම් අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය සහ සහය ඇතිව කටයුතු කර සුදුසු පියවර ගැනීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍ය බව නිරීක්ෂණය වේ. එසේම ඉදිරිපත් වූ සාක්ෂි සලකා බැලීමේ දී ආඥා පනත අනුව ඉහත කී අරමුදලේ භාරකරුවන් සමග කිසිදු සබඳතාවයක් මෙම අරමුදල පාලනය කළ නිලධාරීන් භෞතිකව පවත්වා නැති අතර ඉදිරියේ දී එම නිලධාරීන්ගේ පූර්ණ සහය සහ උපදෙස් ලබාගත යුතු බවත් අවශ්‍ය විධිමත් නීතිමය පියවර ගෙන අරමුදල රැකගැනීමට කටයුතු කළ යුතු බවටත් පෙන්වා දෙන අතර, අදාළ පියවර ගන්නා බව ද දන්වා සිටිමි. එසේම වැඩිදුරටත් අදාළ කම්කරු කාර්යාලයේ කම්කරු කොමසාරිස්තුමා හෝ තුමිය හෝ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් තැන හෝ ඔවුන්ගේ දැනුවත් නියෝජිතයන් මගින් හෝ අවශ්‍ය මාර්ගෝපදේශ ලබා ගනිමින් කටයුතු කිරීම සුදුසු බවව ද පෙනී යයි.

දුම්රිය නිල ඇඳුම් සේවකයින්ගේ අරමුදලේ සුරක්ෂිතභාවය ඉහත පියවර ගැනීම යෝග්‍ය බව පෙනී යන අතර පළමු පක්ෂයට අදාළව පහත පරිදි කටයුතු කිරීම යෝග්‍ය බවට ද නිරීක්ෂණය වේ.

ආර් - 2 හෙවත් ඒ - 1 රණතුංග මහතාට නිකුත් කර ඇති පත්වීමේ ලිපිය අනුව 1991 වසරේ සිට සේවය කරයි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ බවක් එහි සඳහන්ව නැති අතර මහින්දසිරි මහතාට නිකුත් කළ ආර් - 7 ලිපියේ ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ බවක් දක්වා නැත. එසේම චම්පක අනුරුද්ධට නිකුත් කළ ආර් - 8 පත්වීමේ ලිපියේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ බවක් දක්වා නැත. (1992) ආර් - 9 දරන චන්ද්‍රජිත් මහතාට අදාළ පත්වීමේ ලිපියේ ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ බවක් දක්වා නැත. (1996) ඔවුන්ට නිලධාරි මණ්ඩලයේ වැටුප් සකස් කිරීම සහ සෙසු වගකීම් පිළිබඳව සේවා වර්ජනය කිරීම නිසා ඔවුන්ගේ ඉල්ලීම ලබා දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව වැටුප් සකස් කර ගැනීමට සිදු වූ බව දෙවන පක්ෂය ප්‍රකාශ කර ඇතත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිල ඇඳුම් සේවකයින්ගේ අරමුදලට වර්ජනයෙන් බලපෑමක් ඇති වන්නේ නැත. ණය ලබා ගන්නා අයට සහ ණය අය කර ගැනීමට අදාළව බලපාන තත්ත්වයක් පමණක් ඇති බවක් පෙනී යයි. එසේම ණය ලබා ගැනීමට ඉල්ලුම්කරන අයගේ කටයුතු ද ප්‍රමාද විය හැකි බව ද පෙනේ. ආර් - 10 - 2011.07.01 ගිහාන් බණ්ඩාර යන අයට නිකුත් කළ පත්වීමේ ලිපිය අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ බව දක්වා ඇත. 6/2006/5 චක්‍රලේඛනය අනුව එහි දී වැටුප් ගෙවන බව දක්වා ඇත.

රේල් පාරේ කම්කරුවන්ටත් මෙම සංගමයේ නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකි බවට සාක්ෂි අනුව තහවුරු වේ. මෙම නිල ඇඳුම් සේවකයන් යනු කම්කරු නීති පිළිබඳ මනා දැනුමක් සහිත සේවකයන් ද නොවේ. මෙම පරීක්ෂණවලට අදාළ කාලවල සිටි එවැනි සභාපතිවරුන් වෙත ඉදිරිපත් කරන ලද ලිපි අවබෝධයකින් තොරව අත්සන් කර ඇති බව ඔවුන්ගේම සාක්ෂි අනුව තහවුරු වේ. ඥාති සංග්‍රහ ද මෙයට හේතු වී ඇති බවට සාක්ෂි ලබා දී නැතත් මුල් ප්‍රකාශවල සඳහන්ව ඇති බව පෙනේ.

පත්වීම් ලිපිවලට හිඟ වැටුප් ගෙවන බවට සඳහන් කර නැති බවට සාක්ෂි ලබා දී ඇතත් නීත්‍යානුකූලව හිමිවිය යුතු හිඟ වැටුප් තිබේ නම් එම වැටුප් ලබා දිය යුතු වේ. එහෙත් මෙම ආයතනයේ තත්ත්වය අනුව සලකා බැලීමේ දී අදාළ නොවන අයුරින් රාජ්‍ය සේවයේ වැටුප් තල ලබාදීම තුළින් ඔවුන්ට ලැබිය යුතු වැටුපට වඩා ඉහළ වැටුපක් සහ වරප්‍රසාද රාශියක් දැනටමත් ලැබී ඇති හෙයින් හිඟ වැටුප් සහ දීමනා ද ලබාදීම මෙම අරමුදලට කරන බරපතල හානියක් මෙන්ම අරමුදලේ සාමාජිකයන්ට අසාධාරණයක් ද වනු ඇති බව නිරීක්ෂණය කරමි. එසේම ආඥා පනතෙන් අපේක්ෂිත අරමුණුවලට ද පටහැනි බව පැහැදිලි වේ.

රජයේ සේවකයින්ට නිවාඩු පඩි අදාළ නැත. පෞද්ගලික අංශයට ද එවැනි ගෙවීමක් නොකරයි. නිවාඩු ඇත්තේ ලබා ගැනීම සඳහායි. නිවාඩු දින ද ඇතුළත්ව මාසික වැටුපක් ගෙවන හෙයින් රජයේ සේවකයින්ට එබඳු ගෙවීමක් නොකරයි. මෙම ආයතනය කම්කරු නීති පිළිබඳව විධිමත් උපදෙස් ලබා ගැනීමකින් තොරව සකසා ඇති මෙම පත්වීමේ ලිපි රාජ්‍ය අංශයටත් පෞද්ගලික අංශයටත් නැති අමුතුම ආකාරයේ පත්වීමේ ලිපි බව නිරීක්ෂණය වේ. එබැවින් මෙම ආයතනය විධිමත් නීති පද්ධතියකට අනුගත කර කටයුතු නොකළ හොත් අයාලේ ගොස් මෙම අරමුදලේ අරමුණු ඉටු කරනවා වෙනුවට එය විනාශ මුඛයට ඇද වැටෙනු ඇත. දැනට 5800ක පමණ සාමාජික සංඛ්‍යාවක් සිටින දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල ඇති කිරීමේ අරමුණු ආඥා පනතේ දක්වා ඇති අතර එකී ප්‍රතිලාභ වැඩිදියුණු කිරීම, විධිමත් කිරීම සහ සුරක්ෂිත කිරීම කරනවා විනා විනාශ කිරීම සඳහා නිලධාරි මණ්ඩලයක් සහ පාලක මණ්ඩලයක් පත්කිරීමේ අර්ථයක් නැත. විධිමත් දැනුමක් ඇති පුද්ගලයින් පත්කිරීම හෝ පත්වන නිලධාරීන්ට විධිමත් පුහුණුවක් හෝ අදාළ නීති පිළිබඳව දැනුමක් ලබාදීම අරමුදල සුරක්ෂිත කිරීමට අත්‍යවශ්‍ය කරුණකි. අරමුදලට හානි වන ආකාරයේ වියදම් පිළිබඳව තීරණ ගැනීමේ දී පත්වන නිලධාරීන් අරමුදලේ භාරකරුවන්ගෙන් නිසි උපදෙස් ලබා මෙම කටයුතු කරනවා නම් වඩාත් යෝග්‍ය වේ. නැතහොත් කම්කරු දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම ද සුදුසු වේ.

මෙම පරීක්ෂණයට අදාළව කටයුතු කිරීමේ දී ද අදාළ භාරකාර නිලධාරීන් සමඟ සාකච්ඡා කර උපදෙස් ලබාගෙන විධිමත් අයුරින් නීතියට සහ සාධාරණත්වයට අනුගත වන පරිදි කටයුතු කිරීම ආඥා පනත අනුවම දක්වා ඇති තත්ත්වය වුව ද ඊට පටහැනිව නිකුත් කර ඇති මෙම සේවකයින්ට අදාළ පත්වීම් ලිපි සහ සේවා කොන්දේසි සකස් කිරීම හරහා අරමුදල ඇති කිරීමේ අරමුණුවලට පටහැනිව හානි වන අයුරින් දැනටමත් හානිකර කටයුතු සිදු වී ඇති බවට නිරීක්ෂණය වේ. මෙම තත්ත්වයට වගකිවයුතු නිලධාරීන් සොයා බලා නීත්‍යානුකූලව කටයුතු කිරීමට හැකිනම් එය වඩාත් යෝග්‍ය වේ.

මෙම සියලු කරුණු සලකා බැලීමෙන් පසුව සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් මෙම පරීක්ෂණයට අදාළව සලකා බැලිය යුතු බවට තීන්දු කරමි.

1. ඒ අනුව සාප්පු සහ කාර්යාල පනතට අදාළ නිවාඩු 21 වෙනුවට රජයේ සේවකයින්ට අදාළ දින 45ක නිවාඩු ලබා දී ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම හරහා දුම්රිය නිල ඇඳුම් සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට බලවත් පාඩුවක් සිදුකරඇති බව පෙනී යයි. ඊට අදාළව සලකා බැලීමේ දී කිව යුත්තේ නිවාඩු ඇත්තේ විවේකය ලබා ගැනීම සඳහා බවයි. පත්වීම් ලිපිවල විශේෂයෙන් සඳහන් කර නොමැති නම් ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් අවශ්‍ය නොවේ. රජයේ සේවකයින්ට ද ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීමක් නොකරයි. මෙම ආයතනයේ නිවාඩු ලබා දී ඇති ක්‍රමවේදය ද සාවද්‍ය සහගත බැවින් ලබා නොගත් නිවාඩු දින සඳහා ගෙවීම අනවශ්‍ය බවට තීන්දු කරමි. එම තීරණය සාධාරණ සහ යුක්ති සහගතය. සාප්පු හා කාර්යාල පනතින් බැහැරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ කරගෙන කටයුතු කිරීම හේතුවෙන් මෙම ගැටළුව උද්ගත වී ඇත. නිවාඩු ඇත්තේ විවේකය සඳහා ලබා ගැනීමට මිස රාජකාරි කර ඒ වෙනුවෙන් මුදල් ලබා දීම

සඳහා නොවේ. එය සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් බවට ප්‍රකාශ කරමි. විශේෂ අවසරයක් මත සේවයේ යොදවා ගන්නේ නම් පමණක් මුදල් ගෙවීම අවශ්‍ය වේ. එවැනි අවසර යටතේ සේවය කළ බවට සාක්ෂි ලබා දී නැත. ඒ අනුව ලබානොගත් නිවාඩු සඳහා ගෙවීම අනවශ්‍ය බවට තීන්දු කරමි. එය සාධාරණ සහ යුක්ති සහගත බව ප්‍රකාශ කර සිටිමි.

2. එසේම දුම්රිය ගමන් බලපත්‍ර රජයේ සේවකයින්ට ලබාදෙන වරප්‍රසාදයකි. මෙම සේවකයින් දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල නම් වූ සුභසාධක අරමුදලේ සේවකයින් විනා රාජ්‍ය සේවකයින් නොවේ. එසේම දුම්රිය බලපත්‍ර ලබා දීමක් ද මෙම ආයතනය නොකරන අතර ඒ සඳහා දුම්රිය නිල ඇඳුම් අර්ථසාධක අරමුදලේ මුදල් ලබාදීම පමණක් සිදු කරන ආයතනයකි. දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල ඇත්තේ එහි සාමාජිකයින්ගේ යහපත සඳහායි. එබැවින් එම අරමුදලට වන හානිය අවම වන ආකාරයෙන් දෙවන පන්තියේ හෝ තුන්වන පන්තියේ ටිකට් පත් ලබා ගැනීම සඳහා අවසර ලබා ගැනීමත්, ගමන අවසානයේ එම ටිකට් පත් ඉදිරිපත් කර මුදල් පියවා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ගැනීම අරමුදලේ සාමාජිකයින්ගේ පැත්තෙන් ද සාධාරණ වන ලෙස කටයුතු කිරීමකි. එය වඩාත් යෝග්‍ය වන බවට තීන්දු කරමි. මෙම තීන්දුව සාධාරණ සහ යුක්ති සහගත බවට ප්‍රකාශ කරමි.

3. තුන්වන විසඳනාව වන්නේ බඳවා ගැනීමේ කොන්දේසි ප්‍රකාරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පූර්වාදර්ශ කරගනිමින් 2016 දක්වා වැටුප් සංශෝධනය කර ඇතත් 2016 වසරේ සිට 03/2016 පොදු චක්‍රලේඛනයෙන් පසුව වැටුප් සංශෝධනය නොකිරීම යන්නයි.

මෙහි ඇත්තේ නීතිය පිළිබඳව වරදවා කටයුතු කිරීමකි. මෙම සේවකයින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අදාළ නැත. එසේ ගෙවීම හරහා අසාධාරණය සිදු වී ඇත්තේ දුම්රිය නිල ඇඳුම් සේවකයින්ට සහ ඔවුන්ගේ අරමුදලටයි. සේවකයින් 10 දෙනෙකුගේ යහපත වෙනුවෙන් සේවකයින් 5800ක පමණ සහ ඔවුන්ගේ පවුල්වල දහස් ගණනකගේ යහපත වෙනුවෙන් පිහිටුවා ඇති මෙම අරමුදලේ කටයුතු සඳහා පත්කර ගත් සේවකයින් 10 දෙනෙකුගේ යහපත පතා අනවශ්‍ය ආකාරයෙන් වැය කිරීම අසාධාරණ සහ අයුක්ති සහගතය. ඔවුන් සඳහා අදාළ නීතිය වන්නේ සාප්පු හා කාර්යාල පනත වන අතර එමගින් පුද්ගලික අංශයේ සේවකයින්ට නියම කරනු ලබන වැටුප් හා දීමනාවන් පමණි. මෙම පත්වීම් ලිපි නීතිය වරදවා ගැනීම හෝ පුත්‍ර ස්නේහය වැනි පෞද්ගලික කරුණු හේතුවෙන් හෝ නිකුත් කර ඇති ලිපි වන හෙයින් මෙම සේවකයන්ට අදාළව නිවැරදි නීති තත්ත්වයට සාධාරණව අනුගත වී ඒ අනුව සංශෝධනය කර ගනිමින් ආරම්භයේ සිට ගෙවන ලද නියමිත වැටුපට හානියක් නොවන ආකාරයෙන් කටයුතු කිරීම සාධාරණ හා යුක්ති සහගත බවට තීන්දු කරමි. නවක සේවකයන් බඳවා ගැනීමේ දී සාප්පු හා කාර්යාල පනතට අනුගත වී කටයුතු කිරීම හරහා මෙම ගැටළුව නිරාකරණය කරගත හැකි වේ.

නිවාඩු ඇත්තේ විවේකය ලබා ගැනීම සඳහායි. එබැවින් පත්වීම් සේවා විපරිදි ලබා නොගත් ඉතිරි නිවාඩු දින සඳහා ගෙවීම් නොකිරීම නිවැරදි තත්ත්වය බවට තීරණය කරමි. එය සාධාරණ සහ යුක්තිසහගත තීරණයක් බවට තීන්දු කරමි. ඒ අනුව ලබානොගත් නිවාඩු සඳහා ගෙවීම අනවශ්‍ය වන අතර එය සාධාරණ සහ යුක්තිසහගත බවට තීන්දු කරමි.

4. එසේම මෙම පරීක්ෂණයට අදාළ සේවකයින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව නීතිය වරදවා වටහා ගැනීම නිසා හෝ පුත්‍ර ස්නේහය නිසා හෝ කටයුතු කරන ලද තත්ත්වයක් බව මෙම පරීක්ෂණයට ගොනු කළ ප්‍රකාශ සහ සාක්ෂි අනුව තහවුරු වේ. බැලූ බැල්මට මෙහි නීතිය වරදවා වටහා ගැනීමක් ඇති බව පැහැදිලිය. එම මුදල් ගෙවනු ලබන්නේ දුම්රිය නිල ඇඳුම් සේවකයින්ගේ අර්ථසාධක අරමුදලිනි. ඔවුන්ගේ යහපත සහ අභිවෘද්ධිය සඳහා ඇති කළ මෙම අරමුදල එහි සේවය සඳහා බඳවා ගත් සේවකයින් 10 දෙනෙකුගේ සුභ සාධක අරමුදල කර ගැනීමට කටයුතු කර ඇති බව සමස්ථ සාක්ෂි අනුව තහවුරු වන තත්ත්වයයි. නීතිය වරදවා වටහා ගැනීමක් හේතුවෙන් ඉහත කරුණු අනුව ප්‍රතිබන්ධනය වන බවට ද නිගමනය කළ නොහැකිය. ඒ අනුව එම වරප්‍රසාද අත්හිටුවීම සාධාරණ සහ යුක්තිසහගත බවට ද තීන්දු කරමි. ඔවුන්ට දැනටමත් ඉහළ වැටුපක් ගෙවන හෙයින් ඔවුන්ගේ වැටුපෙන් අයකරන ලද යම්කිසි මුදලක් යොදාගෙන දුම්රිය

නිල ඇඳුම් සේවක අර්ථසාධක අරමුදල වැනි සුභසාධන අරමුදලක් ගොඩනගා ගැනීමට හැකි වන අතර දුම්රිය නිල ඇඳුම් සේවකයන්ගේ භාර අරමුදලට හානි නොකර කටයුතු කරගෙන යෑමේ වරදක් ද නොපෙනේ. ඒ අනුව විධිමත්ව පියවර ගෙන තමන්ගේම අරමුදලක් ගොඩනගා ගන්නට කටයුතු කිරීම තුළින් දුම්රිය සේවකයන්ගේ අරමුදලට හානියකින් තොරව සුභසාධන කටයුතු කිරීමේ ක්‍රමවේදයක් සකසා ගැනීම සාධාරණ බව පෙනේ. ඒ අනුව කටයුතු කර ඉහත සියලු හිමිකම් ලබාදීමේ වරදක් ද නොපෙනේ. දුම්රිය සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට හානියක් ද නැත. ඒ අනුව කටයුතු කිරීමෙන් දෙපක්ෂයටම සාධාරණත්වය සිදුවන බව පෙනේ.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බවට ප්‍රකාශ කරමි.

වී. ජයරත්න,
බේරුම්කරු.

2024 ජුනි මස 04 වැනි දින.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.